**ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූනි 14 දින කොමිසම් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 88.85 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 85.35 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 3.50 ක් හෙවත් සියයට 3.94 ක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 85.80 | 82.63 | 3.17 | 3.69 |
| මූලධන | 3.05 | 2.72 | 0.33 | 10.82 |
| **එකතුව** | **88.85** | **85.35** | **3.50** | **3.94** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 00801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2.00 | 1.47 | 1.30 | 1.71 | 7.00 | 5.61 |

**2.3 විගණන නිරීක්ෂණය**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.150,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරිවී තිබුණි.

**3.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2015 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් පෙන්වා දී තිබුණු පොත්වලින් ඉවත් කළ යුතු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව මුදල් රෙගුලාසි 770 විධිවිධාන ප්‍රකාරව 2017 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.3 කාර්යසාධනය**

**පැමිණිලි විමර්ශනය**

ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලැබී තිබුණු පැමිණිලි සම්බන්ධයෙන් සිදුකල නියදි විගණන පරික්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

## (අ) මහජන පැමිණිලි විමර්ශනය

------------------------------

මෙම කාර්යයන් ඉටු කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් වෙනම මහජන පැමිණිලි විමර්ශන අංශයක් ස්ථාපිත කර තිබුණි. එම අංශය විසින් 2016 වර්ෂයේදී සිදු කරන ලද විමර්ශන කටයුතු පිළිබඳ පහත සඳහන් තොරතුරු අනාවරනය විය.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට හා පළාත් කාර්යාල 9 ක් වෙත සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් පරිදි පැමිණිලි 1879 ක් ලැබී තිබුණි.

| **පැමිණිල්ලේ ස්වභාවය** | **2016 වර්ෂයේ පැමිණිලි සංඛ්‍යාව** | **2015 වර්ෂයේ පැමිණිලි සංඛ්‍යාව** |
|---|---|---|
| පොලිසිය විසින් ක්‍රියා නොකිරීම | 737 | 150 |
| පහරදීම | 46 | 10 |
| වධහිංසා පැමිණවීම | 18 | 02 |
| බලය අයථා ලෙස පරිහරණය | 486 | 113 |
| කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම | 09 | 108 |
| වෙනත් | 150 | 34 |
| අල්ලස් දූෂණ | 10 | 02 |
| පක්ෂග්‍රාහී වීම | 257 | 08 |
| බොරු චෝදනා කිරීම | 112 | 19 |
| පොලිස් අත්අඩංගුවේ සිටියදී මරණ සිදුවීම | 03 | - |
| නීති විරෝධි ලෙස රඳවා ගැනීම | 51 | 21 |
| **එකතුව** | **1879** | **467** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පැමිණිල්ලේ ස්වභාවය අනුව විසඳා තිබූ පැමිණිලි සංඛ්‍යාව සම්බන්ධයෙන් වර්ගීකරණයන් සිදු කර නොතිබුණි.

(ii) ප්‍රධාන කාර්යාලය හා පළාත් කාර්යාල මගින් ඉහත සඳහන් පැමිණිලිවලින් 971 ක් හෙවත් සියයට 52ක් විසඳා තිබූ අතර පැමිණිලි 908 ක් හෙවත් සියයට 48 ක් විමර්ශනය නොකර තිබුණි. ප්‍රධාන කාර්යාලය හා පළාත් කාර්යාල මට්ටමින් පහත සඳහන් පරිදි ලැබී තිබූ පැමිණිලි විමර්ශනය කර නොතිබුණි.

| | ලැබුණු සංඛ්‍යාව | පැමිණිලි | විසඳීම් | | නොවිසඳීම් | |
|---|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ප්‍රධාන කාර්යාලය | 186 | | 64 | 34 | 122 | 66 |
| **පලාත් කාර්යාල** | | | | | | |
| බස්නාහිර | 599 | | 153 | 26 | 446 | 74 |
| මධ්‍යම | 221 | | 111 | 50 | 110 | 50 |
| වයඹ | 140 | | 130 | 93 | 10 | 7 |
| දකුණ | 277 | | 211 | 76 | 66 | 24 |
| උතුරු මැද - අනුරාධපුර | 91 | | 80 | 88 | 11 | 12 |
| යාපනය | 26 | | 20 | 77 | 6 | 23 |
| ඌව | 127 | | 82 | 65 | 45 | 35 |
| සබරගමුව | 111 | | 76 | 68 | 35 | 32 |
| නැගෙනහිර | 101 | | 44 | 44 | 57 | 56 |
| **එකතුව** | **1879** | | **971** | **52** | **908** | **48** |

**(ආ) ආයතනික හා විනය පාලනය**

පොලිස් සේවයේ රාජ්‍ය නිවේදිත නිලධාරි ගණයට ඇතුළත් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දක්වාත්, රාජ්‍ය නිවේදිත නිලධාරි ගණයට ඇතුළත් නොවන පොලිස් කොස්තාපල් සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක දක්වා වූ නිලධාරි කණ්ඩායම්වල බඳවා ගැනීම්, පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, සේවය ස්ථිර කිරීම්, සේවය දීර්ඝ කිරීම් විනය පාලනය හා විශ්‍රාම ගැන්වීම් යන සියළු කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සැකසීමේ කාර්යයන් විධිමත් ලෙස ඉටු කිරීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව යටතේ ආයතන හා විනය අංශය යටතේ ක්‍රියාත්මක විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) රාජ්‍ය නිවේදිත නිලධාරින් සඳහා විනය පරීක්ෂණ පැවැත්වීම**

සමාලෝචිත වර්ෂයේදී විනය පරීක්ෂණ සඳහා ලැබුණු ගොනු සංඛ්‍යාව 202 ක් වූ අතර ඉන් ගොනු 44 ක් හෙවත් සියයට 22 ක් සඳහා විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග නිකුත් කර තිබුණි. 2017 මැයි 30 විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග නිකුත් කිරීමේ අපේක්ෂාවෙන් ලිපි ගොනු 05 ක් කටයුතු නිම කර

තිබුණි. විනය නියෝග අපේක්ෂාවෙන් තිබෙන ලිපිගොනු, කෙටුම්පත් චෝදනාපත්‍ර ලැබුණු සංඛ්‍යාව සහ දැනට ක්‍රියා කරමින් පවතින ලිපි ගොනු සංඛ්‍යාව 153 ක් හෙවත් සියයට 76 ක් වී තිබුණි

.

**(ii) රාජ්‍ය නිවේදිත නොවන නිලධාරින් සඳහා සේවය හැරයාම් හා විනය ක්‍රියා සම්බන්ධයෙන් වන පැමිණිලි හා අභියාචනා පරික්ෂාව**

---

රාජ්‍ය නිවේදිත නොවන නිලධාරින්ගේ සේවය හැර යාම් හා විනය ක්‍රියා සම්බන්ධයෙන් වන අභියාචනා පරික්ෂා කිරීමේ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවය හැරයාම්** | **විනය** | **එකතුව** |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී විමර්ශනය කළ යුතු මුළු අභියාචනා සංඛ්‍යාව | 1368 | 1710 | 3078 |
| වර්ෂය තුළ පොලිස්පතිගෙන් අභියාචනා සඳහා වාර්තා ලැබුණු සංඛ්‍යාව | 1049 | 791 | 1840 |
| සමාලෝචිත වර්ෂය අවසානයේදී වාර්තා නොලැබීම මත විමර්ශනය අවසන් නොවූ අභියාචනා සංඛ්‍යාව | 319 | 919 | 1238 |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

---

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 21 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 03 | - |
| (ii) | ද්විතියික මට්ටම | 50 | 48 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 16 | 15 | 01 |
| | **එකතුව** | **96** | **87** | **09** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ කොන්ත්‍රාත් පදනම මත සිටින ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 19 ක්, ද්විතියික මට්ටමේ නිලධාරීන් 02 ක් හා ප්‍රාථමික මට්ටමේ එක් නිලධාරියෙක් ඇතුළත් වී තිබුණි.

(ආ) බස්නාහිර පළාත් කාර්යාලය හැර අනෙක් පළාත් කාර්යාල 08 හි රාජකාරී කටයුතු ආවරණය කිරීම සඳහා පළාත් අධ්‍යක්ෂකවරු 08 දෙනෙක්, විමර්ශන නිලධාරීන් 03 දෙනෙක් හා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 04 දෙනෙක් වශයෙන් සමස්ථ කාර්ය මණ්ඩලය 15 ක් පමණක් සිටින අතර එක් පළාත් කාර්යාලයකට පළාත් අධ්‍යක්ෂවරයෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.